# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 27 දරන
# මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් පිළිබඳ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අගෝස්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 35 යි — තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1983 අංක 27 දරන මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 118/78

මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 27 දරන මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 6 දරන පනතින් සංශෝධිත) මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් පිළිබඳ ආඥාපනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— 179 වන අධිකාරයේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" වැරදි. 8. (1) මුද්‍රණකරුවකු විසින්, මේ ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන අතුරින් තමාට අදාළ වන යම් විධිවිධාන හෝ මේ ආඥාපනතේ 7 වන වගන්තියේ විධිවිධාන හෝ අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට, අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී අධිකරණය විසින් පනවනු ලැබිය හැකි දඩයෙහි ප්‍රමාණය ඉක්ම වුව ද, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) මුද්‍රණකරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන ප්‍රකාශකයකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ මේ ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන අතුරින් තමාට අදාළ යම් විධිවිධාන අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඔහු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී අධිකරණය විසින් පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්ම වුව ද, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.".

ජ 70846—9,560 (83/06)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 ක්, (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළැඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.